**හලාවත නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු.11,387,107ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය 2020.12.31 දිනට යාවත්කාලීන කිරීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මෝටර්රථ හා කරත්ත රු.6,519,296ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය 2020.12.31 දිනට යාවත්කාලීන කිරීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ලී බඩු හා සවිකිරීම් රු.3,408,135ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය 2020.12.31 දිනට යාවත්කාලීන කිරීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

**----------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 14කට අදාළව ඉදිරිපත් කළ උපලේඛන/ උපයෝගි පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් එකතුව රු.45,009,474ක් විය. | ලේඛන නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ලේඛන පරීක්ෂාවේදී වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂ බැවින් 2020 ගිණුම් සැකසීමේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.8,871,877ක් වූ පෙර ගෙවුම් ශේෂ වටිනාකම හා රු.73,940ක් වූ සභාව විසින් කළ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020.12.31 දින වන විට අවසන් ගිණුම සඳහා අවශ්‍ය තොරතුරු සාක්ෂි සමග සොයා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.39,962,029ක් වූ අතර එයින් ඉකුත් වර්ෂවලට අදාළ රු.31,086,616ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020.12.31 දින වන විට අවසන් ගිණුම සඳහා අවශ්‍ය තොරතුරු සොයා නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.281,209,417ක් වූ ගිණුම් විෂයයන් 07ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අවසාන ගිණුම් සමග උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | මෙම ශේෂයන්ට අදාළ උපලේඛන ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

--------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත | | | |
| | 170 වගන්තිය | වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟව පැවති රු.60,186,065ක් වූ වරිපනම් බදු හා හිඟ බදු කුලී සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | වංචල දේපළ තහනමට ගෙන රු.4,829,589ක මුදලක්ද ජංගම සේවා සිදු කිරීමෙන් රු.729,280ක මුදලක්ද පෙර හිඟයෙන් අය කරගෙන ඇති අතර හිඟ කඩකුලී සඳහා නව තක්සේරුව ලැබීමෙන් අනතුරුව නොගෙවන බදුකරුවන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571 වගන්තිය | තැන්පත් ශේෂයෙහි ඇතුළත්ව තිබූ රු.2,963,943ක් වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020.12.31 දින වන විට අවසන් ගිණුම සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග හා 1978 ජූනි 07 දින 320/8 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද සංශෝධනය | | | |
| පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝග 36 වෙනි වගන්තිය | මාසිකව සභාව විසින් ගෙවිය යුතු වූ රු.9,021,520 ක විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා නොතිබුණි. | අදාල දායක මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යොමුකර අදාළ තොරතුරු (විශ්‍රාමික තොරතුරු) ඉල්ලීම් කර යවන ලද අතර, 2020 පෙබරවාරි මස 06 වන දින වන විට ලැයිස්තුවේ සඳහන් 71 දෙනා අතුරින් 23 දෙනෙකු පිළිබඳව තොරතුරු ලැබී නොමැති බැවින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලිඛිත තහවුරුවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,953,270ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,885,243ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

---------------

**2.2.1 අක්‍රීය බැංකු ගිණුම්**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහජන බැංකුවේ පවත්වාගෙන ගොස් ඇති දැනට අක්‍රීය ජංගම ගිණුම් 02ක පිළිවෙලින් රු.24,686ක හා රු.1,242ක ශේෂ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාළ ගිණුම් ශේෂයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. | 2020.12.31 දින වන විට අවසන් ගිණුම සඳහා අවශ්‍ය තොරතුරු සොයාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 23,116 | 23,018 | 19,348 | 40,868 | 22,384 | 22,966 | 22,770 | 37,198 |
| කුලී | 57,756 | 41,295 | 38,729 | 37,282 | 16,467 | 16,534 | 12,369 | 34,716 |
| බලපත්‍ර ගාස්තු | 2,121 | 1,866 | 1,875 | - | 1,000 | 1,244 | 1,235 | 9 |
| වෙනත් ආදායම් | 16,651 | 12,012 | 13,702 | 68,984 | 47,031 | 40,225 | 28,655 | 70,674 |
| | 99,644 | 78,191 | 73,654 | 147,134 | 86,882 | 80,969 | 65,029 | 142,597 |

* රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුළු බිල්කළ ආදායම රු.78,191,551ක් වූ අතර වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් හා 2019 ජනවාරි 01 දින මුළු හිඟයෙන් රු.73,653,992ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුල සමස්ත ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 33ක් පමණ විය. | හිඟ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හලාවත වැල්ල ප්‍රදේශයෙන් අයවිය යුතු වරිපනම් ආදායම අය නොවීමද, බිල්කළ රු.10,000,000ක මුද්දර ගාස්තු වර්ෂයට අදාලව කිසිදු මුදලක් අය නොවීම හා බිල්කල කඩ කුලී ආදායම වන රු.18,648,350ක මුදලින් වර්ෂයට අදාළව අයවී තිබුණේ රු.12,194,582ක මුදලකි. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයෙන් පසු කඩ කුලී සංශෝධනයක් කිරීමට සභාව අපොහොසත්ව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලිය රු.37,282,256ක් විය. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුල් ගිවිසුමේ කඩ ලබා දුන් දින සිට වසර 20ක කාලයකට බිම් කුලියත්, එම වසර 20ක කාලයෙන් අනතුරුව බිම් කුලිය හා කඩ කුලිය යන දෙකම අය කිරීමට සුදුසු බව නිර්දේශ කර එය ක්‍රියාත්මක කරන ලෙස වයඹ පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් ලිඛිතව දන්වා ඇති අතර ඒ අනුව තක්සේරුව සිදු කර නව තක්සේරුවක් ලබා දුන් පසු හිඟ කඩකුලී මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ පළාත් සභාවට ඉදිරිපත් කළ අතුරු ව්‍යවස්ථා 03ක් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුවත් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 එකී අතුරු ව්‍යවස්ථා ගරු මහ සභාවට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇත. දැනට එම අතුරු ව්‍යවස්ථා පරිවර්තනය කිරීම සඳහා කටයුතු කරමින් සිටී. තවද පළාත් පාලන සංසදය සමග එක්ව, අතුරු ව්‍යවස්ථා 2020 වර්ෂයේදී සකස් කර අනුමත කරවා ගැනීමටද කටයුතු කරමි. |

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇස්තමේන්තු වටිනාකම රු.8,285,000ක් වූ වැඩසටහන් 11ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | සැලසුමට අනුව අදාළ ව්‍යාපෘතීන් කඩිනමින් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පාස්කු දින ප්‍රහාරය නිසා රටේ පැවති තත්ත්වයන් මත එම වසරේ වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීම, උග්‍ර ජල හිගයක් පැවතීම නිසා වැඩසටහන් නොපැවැත්වීම හා ප්‍රජා මණ්ඩල මගින් අදාළ වියදම් දැරීම නිසා ව්‍යාපෘතීන් සඳහා ලද ප්‍රතිපාදනයන් ඉතිරිව පවතී. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා සීමාව තුල ජනනය වන මුළු කසළ ප්‍රමාණය ටොන් 18ක් පමණ විවෘත ස්ථානවලට බැහැර කරමින් තිබූ අතර කොම්පෝස්ට් අංගනයක් නොමැති බැවින් කොම්පෝස්ට් කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් ආරම්භ කළ යුතු වේ. | කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම් 02හි පරිසර යෝග්‍යතා, තක්සේරු වාර්තාවන්හි ශක්‍යතාවන් හා ගැලපීම් සලකා සුදුසු ඉඩමක් මිලදීගෙන කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට බලාපොරොත්තු වේ. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 22ක් සඳහා ඉලක්කයන් හඳුනාගෙන එම අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමේ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුල අරමුනු 21ක් ඉටු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කළ යුතු වේ. | පූර්ව ළමා සංවර්ධන අධිකාරිය මගින් ළමා අපචාර හා ළමා හිංසනය වැළැක්වීමේ වැඩසටහන් සිදුකර ඇති බැවින් එහි භෞතික ප්‍රගතියක් පමණක් පෙන්නුම් කරයි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2003 හා 2004 වර්ෂවල සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත යැවිය යුතු අර්ධ වාර්ෂික වාර්තා ප්‍රමාද කර යැවීම හේතුවෙන් රු.103,842ක අධිභාර මුදලක් ගෙවා තිබුණු අතර එම අධිභාර මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | අධිභාර මුදල් අදාළ නිලධාරීන්ගෙන් කඩිනමින් අයකර ගත යුතු වේ. | 2013 පළමු අර්ධ වර්ෂයේ වාර්තාවට අදාළ අධිභාර මුදල වන රු.994 ගෙවන ලෙස වගකිව යුතු නිලධාරියාට ලිඛිතව දන්වා ඇත. 2003, 2004 වර්ෂවල මෙම රාජකාරිය ඉටුකරන ලද නිලධාරින් හඳුනාගැනීම සඳහා විමර්ශනයක් සිදුකිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව දන්වා ඇත. |
| (ආ) | 2018 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල රු.2,951,449ක් වැයකර මිලදීගෙන තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 21ක්, ක්‍රියා කරවීම සඳහා පවතින විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ස්ථානගත නොකරම වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි. | කඩිනමින් විදුලි අවශ්‍යතාවය සපුරාගැනීමට කටයුතු කළ යුතු වේ. | වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට විදුලිය ලබා ගැනීම සඳහා ට්‍රාන්ස්පෝමර යන්ත්‍රයක අවශ්‍යතාවය පවතිනු ඇත. වායුසමීකරණ යන්ත්‍රවලින් කිහිපයක් භාවිතාවට ගෙන ඇති අතර මේ වන විට ට්‍රාන්ස්පෝමරයට ස්ථාපිත කිරීම සඳහා විදුලි බල මණ්ඩලයෙන් ඇස්තමේන්තු ලබා ඇති අතර 2020 අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | | | |
|---|---|---|---|
| (ඇ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමේදී 2018 වර්ෂය අවසානයට රු.1,002,778ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ අතර එම මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා තිබූ මුදල ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | එකතු කළ අගය මත බදු වාර්තා සංශෝධනය කර 2019-09-05 දින දේශිය ආදායම් දෙපාර්තුමේන්තුවට භාර දී ඇත. එම වර්ෂයට අදාළ කාර්තු 02 සඳහා රු 639,982ක මුදල ආපසු ලබා ගැනිමට අදාළ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවෙන් ලබා දුන් ලිපි ලේඛන සම්පූර්ණ කර 2019-11-13 දින නැවත භාර දී ඇත. |

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩු වී පැවති අතර, එම තනතුර සඳහා ද්විතියික ශ්‍රේණියේ සංවර්ධන නිලධාරියෙකු පත් කර තිබුණි. තවද මුළු සේවක සංඛ්‍යාව තුල ද්විතියික අංශයේ ගිනි නිවන ඒකකයේ 36 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | අදාළ පුරප්පාඩු විධිමත් පරිදි කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ලේකම් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111/11 ශ්‍රේණියේ තනතුරක් වන අතර එම තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතී. එම තනතුර වැඩ බලන ලේකම්වරු යටතේ පවත්වාගෙන ආ අතර මේ වන විට ද්විතියික ශ්‍රේණියේ සංවර්ධන නිලධාරියෙකු ලේකම් තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර ඇති බව කාරුණිකව දන්වමි. |

**3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිගුකාලීනව නිකුත් නොවී පවතින රු.43,488ක් වටිනාකමැති විදුලිය අයිතම 08ක් ගබඩාවේ පැවති අතර එම අයිතම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වත්කම් අවශ්‍යතාවය අනුව මිලදී ගත යුතු අතර, කඩිනමින් අදාළ කාර්යය සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. | නවීන තාක්ෂණය පිවිසීම, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම යටතේ බලශක්ති අර්බුදයට පිළියමක් වශයෙන් LED බල්බ් භාවිතයට යොමුවීම හේතුවෙන් මෙම විදුලි උපාංගයන් පරිහරණය කිරීම ඉතා සීමා විය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අයවැය විෂයයන් 84ක් සඳහා සලසාගෙන තිබුණු රු.3,462,000ක මුළු ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | අයවැය ඇස්තමේන්තු තාත්විකව සැකසිය යුතු වේ. | පළාත් පාලන නගර සභා අයවැය ලේඛනය ව්‍යාපෘති අයවැය ලේඛනයක් ලෙස සකස් කරනු ලැබේ. එම නිසා ව්‍යාපෘතිවලට අදාළ වැය ශිර්ෂ සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම සිදුකරනු ලබයි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන ආකාරයට අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමට අවධානය යොමුවී නොතිබීම නිසා ගොඩනැගිලි ඇතුළු වත්කම් කළමනාකරණය, ආදායම් ඉපයීම හා මහජන සේවා ඉටු කිරීම වැනි වැදගත් ක්ෂේත්‍ර අභ්‍යන්තර විගණනයෙන් අත්හැරී තිබුණි. | සභාවේ සියළු කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණනය සිදුකර ඇත. එහෙත් අභ්‍යන්තර විගණනයට ලක් නොවූ ක්ෂේත්‍රයන් 2020 වර්ෂයේ හැකිතාක් දුරට විගණනය කිරිමටත් අභ්‍යන්තර විගණන කමිටු ශක්තිමත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |